ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2018 දෙසැම්බර් 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 නොවැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2018 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 1.0%ක් බව ප්‍රකාශ කලේය. පසුගිය ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 0.1%ක් ලෙස වාර්තා විය. 2018 නොවැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.78%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.80%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 නොවැම්බර් මාසයේ 8.4% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 6.9%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.5%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 ඔක්තෝම්බර් මාසයේ 124.9ක් වූ දර්ශකාංකය 2018 නොවැම්බර් මාසයේ 127.7ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 නොවැම්බර් මාසයේ දර්ශකාංකය 2.8ක වැඩිවීමක් එනම් 2.2ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 2.19%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.04%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, අමු මිරිස්, සහල්, දෙහි, අර්තාපල්, ලොකුළූණු, රතුළූණු, බිත්තර, පොල්, දෙල්, මිරිස් කුඩු, තේ කොළ/කුඩු, කොස් මදුළු හා කොස් ඇට, මඤ්ඤොක්කා සහ තිරිඟු පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් අළුත් මාළු, කුකුල් මස්, කෙසෙල්, පැපොල්, සීනි, අඹ, කරවල, පොල්තෙල්, අන්නාසි, සහ ගම්මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 නොවැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'සෞඛ්‍ය', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'විවිධ භාණ්ඩ හා සේවා', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ආපනශාලා සහ හෝටල්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත් 'සන්නිවේදන', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' සහ 'ප්‍රවාහන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම අඩුවීමක් වාර්තා විය. තවද පසුගිය මාසය හා සංසන්දනය කලවිට සහ 'අධ්‍යාපන' කාණ්ඩයේ කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවීය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | -0.8 | 0.9 |
| | ඔක්තෝම්බර් | 124.9 | 0.4 | 0.1 |
| | නොවැම්බර් | 127.7 | 2.2 | 1.0 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව